මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

## <u>සියළු මාධ්‍ය ආයතන වෙත කරන ආයාචනයයි</u>

1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් පිහිටුවා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට සිදුකරන ලද 19 වන ව්‍යාවස්ථා සංශෝධනය මගින් ශ්‍රී ලංකා ව්‍යාවස්ථාවට ඇතුළත් කර ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දිවයිනේ සිටින සියළුම පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ෂිත වන මානව හිමිකම් සංස්කෘතියක් රට තුළ ඇති කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ප්‍රතිපාදන අනුව 2020 අගෝස්තු මස 05 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සඳහා සභිතයින් පත්කර ගැනීමේ මැතිවරණය ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව මෙම මැතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍යවන්නා වූ ක්‍රියාමාර්ග සූදානම් කරමින් ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 104 ආ (5) (ආ) අනුව්‍යාවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන 2020.06.03 වන දින අංක 2178/24 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කර ඇත. මෙම මාධ්‍ය උපමාන වලට අනුව සියළුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මෙම මාධ්‍ය උපමාන වලින් බැඳී, එම උපමාන වලට අනුකූලව ක්‍රියාත්මක වන බවට වගබලා ගත යුතුය. තවද වැඩිදුරටත් එහි දැක්වෙන්නේ මෙම උපමාන වලට අනුකූලව කටයුතු කිරීම සමාජ වෙබ් අඩවි හිමිකරුවන්, සමාජ වෙබ් අඩවි පරිපාලකවරුන්ගේ ද, කේබල් රූපවාහිනී නාලිකා හිමිකරුවන්ගේ ද වගකීම වන බවයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙම මාධ්‍ය උපමාන තුළ අඩංගු අංක 24 හා 25 යන උපමාන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්නෙමු. එනම්;

*"24. සෑම මාධ්‍ය ආයතනයක්ම ආගමික විශ්වාස, ඇදහිලි, කථන භාෂා, වාර්ගිකත්වය, චාරිත්‍ර හා කුල ගෝත්‍ර ඇතුළු විවිධ හේතු පදනම් කරගනිමින් ශ්‍රී ලාංකික ජනතාව තුළ වෛරය හා නොඉවසන සුළුබව ඇතිවන හෝ ඇතිකරවන ආකාරයට ප්‍රචාරණ කටයුතු විකාශය කිරීම, ප්‍රචාරය කිරීම හෝ පළ කිරීමෙන් වැළකිය යුතුය.*

*25. සෑම මාධ්‍ය ආයතනයක්ම සමාජය තුළ හෝ දේශපාන ක්‍රියාකාරීන් අතර වෛරී සහගත දේශපාලනය ප්‍රවර්ධනය වන ආකාරයේ කටයුතු විකාශය කිරීමෙන්, ප්‍රචාරය කිරීමෙන් හෝ පළ කිරීමෙන් වැළකිය යුතුය."*

මූලාශ්‍රය : 2020 ජූනි මස 03 වන බදාදා අංක 2178/24 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය

ශ්‍රී ලංකාව තුළ පවතින වෙනස්කම් පදනම් කරගෙන ශ්‍රී ලාංකීය ජනතාව තුළ වෛරී සහ නොඉවසන සුළුබව ඇතිවන හෝ ඇතිකරවන ආකාරයේ විකාශය කිරීම, ප්‍රචාරය කිරීම් හෝ පළ කිරීම් වලින් වැළකිය යුතු බව

ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி: 94-11- 2505580/81/82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 011-2505575 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

මෙමගින් අවධාරණය කර ඇත. තවද සමාජය තුළ හෝ දේශපාලන ක්‍රියාකාරීන් අතර වෛරී සහගත දේශපාලනයක් ප්‍රවර්ධනය වන ආකාරයේ විකාශය කිරීම්, ප්‍රචාරය කිරීම් හෝ පළ කිරීම් වලින් වැළකිය යුතු බව වැඩිදුරටත් දක්වා ඇත. සමස්තයක් ලෙස රට තුළ පවතින විවිධත්වය සමාජය තුල බෙදීමක් ඇතිකරවන ආකාරයේ කටයුතු තුළින් එක් එක් කණ්ඩායම් සෙසු කණ්ඩායම් කෙරෙහි වෛර සහගත ආකාරයෙන් හැසිරීමට යොමුකරවන ආකාරයේ කටයුතු වලින් වැළකී සිටින ලෙස මෙමගින් ඉල්ලීමක් කර ඇත.

නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ජීවගුණය සුරක්ෂිත කිරීම සඳහා කිසිවෙකුත් අත්නොහැරෙන මැතිවරණයක් පැවැත්වීම අත්‍යාවශ්‍ය කරුණකි. එහිදී ජනතාව වෙත දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල මතය ගෙන යාමේදී ප්‍රධාන මාධ්‍යයක් ලෙස ජනමාධ්‍ය වෙත පැවරී ඇත්තේ අතිවිශාල වගකීමකි. ඒහිදි පුද්ගලයින්ට වෙත තම මතය ගෙන ගියත් ඡන්දදායකයාට තම දේශපාලන මතය මැතිවරණයේදි ඡන්ද පත්‍රිකාව හරහා නිදහස් , සාධාරණ සහ බලපෑමකින් තොරව ප්‍රකාශ කිරීමේ අවකාශයට ජන මාධ්‍ය බාධා නොකළයුතුය. ඒහිදි රට තුළ පවතින විවිධත්වය සමාජය තුල බෙදීමක් ඇතිකරවන ආකාරයේ විකෘති පුවත් සහ කරුණු අතිශෝක්තියෙන් ගෙනහැරපාන ආකාරයේ පුවත් පල කිරීමෙන් වැලකිම සම්බන්ධයෙන් ජනමාධ්‍ය වෙත සුවිශාල වූ වගකීමක් පැවරී ඇත.

ඒ අනුව අගතිගාමී නොවන මාධ්‍ය හැසිරීමක් මඟින් තම සුවිශේෂී වගකීම ඉටුකරනු ඇතැයි යන්න ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉතාමත් ඉහළ බලාපොරොත්තුවක් ශ්‍රී ලාංකීය මාධ්‍ය ක්ෂේත්‍රය වෙත තබා ඇත. මේ සම්බන්ධයෙන් ඔබගේ ක්‍රියාකාරී මධ්‍යස්ථ මැදිහත්වීම අප දියුණු ප්‍රජාතන්ත්‍රවාදී සහ මානව හිමිකම් වලට ගරු කරන සමාජයක් බිහිකිරීම වෙනුවෙන් ඔබ වෙතින් අපේක්ෂා කරන්නෙමු.

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2020 ජූලි මස 20